**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2014**
----------------------------------------------

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනතේ 16(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(අ) ශේෂපත්‍රයේ නිරූපණය කෙරෙන පිරිවැය රු. 73,500 ක් වූ ඇත් තටාංගනය හා භූමිය ඇසළ භාරයට අයත් බවට හිමිකම් සහතික නොවුණි.

(ආ) කුසලතා පූර්ණ ශිල්පීන් 9 දෙනෙකුට ජනාධිපති සම්මාන ත්‍යාග වශයෙන් රු.45,000 ක් ගෙවීම් කර ඇතත්, එම මුදල අදාළ පුද්ගලයින් ලබාගත් බවට තහවුරු කිරීම් නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත | |
| (i) 8 (1) වගන්තිය | ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන් සතර දෙනා, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා සහ ජනාධිපතිවරයා නම් කරන ලද සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කර නොතිබුණි. |
| (ii) 16 (3) වගන්තිය | භාරයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් මණ්ඩලය විසින් වර්ෂයක් පාසා පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii)19 (2) වගන්තිය සහ 19(3) වගන්තිය | බලපත්‍ර සඳහා අනුමැතිය දීමේදී යෝජිත ගාස්තුව හෝ අයකිරීම අධික හෝ අසාධාරණද යන්න පිළිබඳ නිවැරදි තහවුරුවකින් තොරව ඇසළ භාරය විසින් අනුමැතිය ලබා දීම නිසා ඇතැම් ආයතන |

| | | |
|---|---|---|
| | | ඇ.ඩොලර් 70 සිට ඇ.ඩොලර් 85 දක්වා වූ අධික මිල ගණන්වලට විදේශිකයින්ට ආසන පනවා තිබුණි. |
| | (iv) 20 වගන්තිය | 19(1) වගන්තිය පරිදි ආසන පැනවීම සඳහා බලපත්‍ර ලබාගැනීමට අවසරය ඉල්ලුම් කිරීමේදී එම ඉල්ලුම් පත්‍රවල සඳහන් කර ඇති ආසන ප්‍රමාණය ඉක්මවා අවසරයකින් තොරව පනවා තිබූ ආසන වලින් පෙරහැර භාරය විසින් රු.1,746,050 ක ආදායමක් එකතුකර ගෙන තිබුණි. නමුත් අවසරයකින් තොරව පෙරහැර නැරඹීම සඳහා ආසන පැනවූ එම පුද්ගලයින් සම්බන්ධයෙන් හා අවසරයකින් තොරව වැව් බැම්ම මත විවිධ ආයතන පෙරහැර නැරඹීම සඳහා ආසන පැනවීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 384 | භාරය විසින් සමාලෝචිත වර්ෂයේ රු.9,160,421 ක වටිනාකමැති චෙක්පත් 225ක් රේඛණය නොකර විවෘත චෙක්පත් ලෙස නිකුත් කර තිබුණු අතර, චෙක්පත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවී මාස 6ක් ඉකුත්වී ඇති රු.20,000 ක් වටිනා චෙක්පත් 3ක් සම්බන්ධයෙන් 2015 පෙබරවාරි 28 දින වන විටත් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි |
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.1 ඡේදය | අරමුදලෙහි අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය එහි පාලන අධිකාරිය සහ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 වන දිනට පෙර අදාළ ගරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන සැප්තැම්බර් 30 වන දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වුවත්, විගණනයට ඉදිරිපත් වූ අයවැය ලේඛනයට එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ මහනුවර ඇසළ පෙරහැර භාරයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,805,456 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.753,631ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,051,825 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ඇසළ පෙරහැර නැරඹීම සඳහා රැජිණ හෝටලයේ කොරිඩෝව බදුදීමෙන් මහනුවර මහා නගර සභාව රු.5,317,500 ක බදු ආදායමක් උපයාගෙන තිබූ අතර, 2013 ජූලි 12 දින භාරය සම්බන්ධයෙන් පැවැත්වූ රැස්වීම් වාර්තාව මඟින් 2013 වර්ෂයේ නගර සභා ආදායමෙන් සියයට 20 ක ප්‍රමාණයක් අයකර ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද එය අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2014 වර්ෂය සම්බන්ධයෙන් එවැනි තීරණයක් ගෙන නොතිබුණි.

(ආ) රැජිණ හෝටලයේ කොරිඩෝව බදු දීමේදී බදු ගැනුම්කරු විසින් පෙරහැර නරඹන්නන් සඳහා නිකුත් කිරීමට මුද්‍රණය කරනු ලබන සියළුම ප්‍රවේශ පත්‍ර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර, මුද්‍රා තබා සියයට 25 ක ගාස්තුවක් පෙරහැර භාරයට ගෙවා නියමිත බලපත්‍රයක් ලබාගත යුතු බවට බදු කොන්දේසියක් මහා නගර සභාව විසින් පනවා තිබුණද, එම කොන්දේසිය පරිදි අදාළ ආදායම පෙරහැර භාරයට ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අවසර ලබා ගත් ආසන පැනවීම මත බාහිර පාර්ශවය විසින් දින 5 ක් සඳහා උපයාගෙන තිබුණු රු.24,507,563 ක මුදලින් සියයට 25 ක් වූ රු. 6,126,891 ක ආදායම් භාරයට අහිමි වී තිබුණි.

(ඇ) පෙරහැර නැරඹීම සඳහා රැජිණ හෝටලයේ ආසන පැනවීමෙන් පමණක් රු.28,159,250 ක මුදලක් නගර සභාව හා බාහිර පුද්ගලයන්ට බදු දීමෙන් උපයා ගෙන තිබූ නමුත්, පෙරහැර භාරයේ සමස්ත ආදායම රු.7,164,250 ක් වී තිබුණි. මෙය බාහිර පාර්ශවයන්ගේ ඉපයීම් වලින් සුළු ප්‍රමාණයක් විය.

**4.2 හඳුනා ගන්නා ලද පාඩු**

මහා භාරකරු භාරයේ පවතින රු.20,000,000 ක් වූ ආයෝජන මුදලට මහා භාරකරුගෙන් සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු රු.1,700,000ක් වූ පොලියෙන් සියයට 4 ක මුදලක් ආදායම් ගාස්තු ලෙස රඳවා ගැනීම හේතුවෙන් රු. 68,000 ක මුදලක් භාරයට අහිමි වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

මහනුවර මහා නගර සභාව සහ වෙනත් විවිධ ආයතන ඇසළ පෙරහැර නැරඹීම සඳහා භාරයේ අවසරයකින් තොරව ආසන පැනවීම නිසා සාමාන්‍ය මහජනතාවට දළඳා පෙරහැර නිදහසේ නැරඹීමට

ඇති අවස්ථාව අහිමි වී තිබුණද, ඒ සම්බන්ධයෙන් පෙරහැර භාරය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය ලේඛනය
(ආ) වියදම් දැරීම හා ආදායම් රැස් කිරීම
(ඇ) ආයෝජන